# ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ පුරප්පාඩු පිරවීම

## (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය)

# පහත තනතුරු සඳහා

# ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

**(1) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි (තනතුරු සංඛ්‍යාව 01)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය හෝ ව්‍යවහාරික විද්‍යාව (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) හෝ රසායනික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ පංති සාමාර්ථයක් සහිතව සමත්වීම

**හෝ**

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය හෝ ව්‍යවහාරික විද්‍යාව (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) හෝ රසායන විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක දෙවන පෙළ පහළ පංති සාමාර්ථයක් සහිතව සමත්වීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක පශ්චාත් උපාධියක් ලබා තිබීම

**හෝ**

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය හෝ ව්‍යවහාරික විද්‍යාව (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) හෝ රසායනික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**(අ) හෝ (ආ) හෝ (ඇ) සමඟ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය හෝ ව්‍යවහාරික විද්‍යාව (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) හෝ රසායනික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම හා පළමු උපාධිය ලැබීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පර්යේෂණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම හා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරියෙක් ලෙස වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**හෝ**

(ආ) අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ පශ්චාත් උපාධියක් (Msc/M. phill) ලබා තිබීම. (මෙම පශ්චාත් උපාධිය මෙම ආයතනය වෙත පර්යේෂණ නිලධාරියෙකු ලෙස AR 1-II ශ්‍රේණියට බඳවා ගැනීමේදී මූලික සුදුසුකමක් ලෙස සලකා බැලූ පශ්චාත් උපාධියට අමතරව ලබා ගත් පර්යේෂණ පශ්චාත් උපාධියක් විය යුතුය) සහ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරියෙකු ලෙස වසර 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

I. **වෙනත් සුදුසුකම් :** ප්‍රකාශයට පත්කර ඇති පර්යේෂණ සහ ලිපි, පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රය වෙත ලබාදී ඇති දායකත්වය, කළමනාකාර හැකියාවන් හා නායකත්ව හැකියාවන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

II. **වයස් සීමාව :** අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

III. **වැටුප් ක්‍රමය :** AR 2 - 2016 : රු. 71,585.00 - 10 X 1,910 - රු. 90,685.00

IV. **දීමනා :** රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ

**(02) පර්යේෂණ නිලධාරි (තනතුරු සංඛ්‍යාව 02)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය හෝ ව්‍යවහාරික විද්‍යාව (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) හෝ රසායනික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) පංති සාමාර්ථයක් සහිතව සමත් වීම

**හෝ**

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය හෝ ව්‍යවහාරික විද්‍යාව (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) හෝ රසායනික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක දෙවන පෙළ (පහළ) පංති සාමාර්ථයක් සහිතව සමත් වීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක පශ්චාත් උපාධියක්/ ඩිප්ලෝමාවක් ලබා තිබීම

**හෝ**

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය හෝ ව්‍යවහාරික විද්‍යාව (ආහාර විද්‍යාව සහ තාක්ෂණය) හෝ රසායනික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විශේෂ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පශ්චාත් උපාධියක් ලබා තිබීම

I. **වෙනත් සුදුසුකම්**

ප්‍රකාශයට පත්කර ඇති පර්යේෂණ සහ ලිපි, පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රය වෙත ලබාදී ඇති දායකත්වය, කළමනාකාර හැකියාවන් හා නායකත්ව හැකියාවන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

II. **වයස් සීමාව :** අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

III. **වැටුප් ක්‍රමය :** AR 1 - 2016 : රු. 51,285.00 - 5 X 1,135 -5 X 1,335-15X1,590 - රු. 87,485.00.

IV. **දීමනා :** රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**(03) කාර්මික සහකාර (ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ) (තනතුරු සංඛ්‍යාව - 01)**

**සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන් හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) වැනි මට්ටමට නොඅඩු මට්ටමක යාන්ත්‍රික ,විදුලි, යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**පොදු සුදුසුකම්**

I. **වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

II. **වැටුප් ක්‍රමය :** සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MA 2 – 2 - 2016 : රු. 30,310 - 10 X 300 - 07 X 350 - 04 X600 - 20 X 710 - රු.52,360.00

III. **දීමනා :** රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**(04) රසායනාගාර සහකාර (තනතුරු සංඛ්‍යාව -02)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

(1) සිංහල /දෙමළ

(2) ගණිතය සහ

(3) තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) කින් සමත්ව තිබීම

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම හෝ පැරණි නිර්දේශයෙන් විෂයයන් 04 ක් සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**සුදුසුකම්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පී සේවා ගණයන්හි පහත ආ, ඇ සහ ඉ සඳහා සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එක්වරකදී පළමු භාෂාව/ ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකට නොඅඩුව සමත්ව තිබීම

**සහ**

කාර්මික විද්‍යාලයෙන් හෝ වෙනත් පිළිගත් ආයතනයකින් ඉල්ලුම් කරනු ලබන තනතුරට අදාළ පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

I. **වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

II. **වැටුප් ක්‍රමය :** සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

MA 1 - 2 - 2016 : රු. 27,910 - 10 X 300 - 07 X 350 - 12 X600 - 12 X 710 - රු.49,080.00

III. **දීමනා :** රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**(05) විදුලි කාර්මික (තනතුරු සංඛ්‍යාව - 01)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසයෙන් විෂයයන් දෙකක් සමත් වී තිබිය යුතුය .

**ශිල්පීය නිපුණතාව/ප්‍රවීණතාව**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් NVQ 4 මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ සහතිකයක් ලබා තිබීම.

**පොදු සුදුසුකම්**

I **වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

II. **වැටුප් ක්‍රමය :** PL 3 - 2006 : රු. 26,290 - 10 X 270 - 10 X 300 - 10 X 330 - 12X350 - රු.37,490.00

III. **දීමනා :** රජය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
2. රාජ්‍ය හෝ සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අය තම ඉල්ලුම් පත්‍රය අදාළ දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
3. තෝරාගනු ලබන අයදුම්කරු 1956 අංක 22 දරන රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති, මතුවට පනවනු ලබන නීතිරීතිවලටත් යටත්වනු ඇත.
4. තෝරාගනු ලබන අයදුම්කරුවන් පත්කරනු ලබන දින සිට මාසික වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. ආයතනය අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් 12% සහ 3% ගෙවනු ලැබේ.

අදාළ සහතිකවල ඡායා පිටපත් හා අයදුම්කරු හඳුනන ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග අයදුම්කරු තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ලියාපදිංචි තැපෑලෙන් 2024/12/16 වෙනි දින හෝ ඊට පෙර **සභාපති, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය,** ජයන්ති මාවත, අනුරාධපුර ලිපිනයට එවීමට කටයුතු කරන්න. ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කරන්න.

**සභාපති,**
**ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය,**
**ජයන්ති මාවත, අනුරාධපුර.**